## 2. විශේෂ කොරියානු භාෂා ප්‍රවීණතා පරීක්ෂණය (Special EPS Topik)

දකුණු කොරියානු රාජ්‍යයෙහි රැඳීසිටීමට ලබාදී ඇති අවසරලත් කාලසීමාව තුළ (වසර 04 මාස 10) නීත්‍යානුකූලව සේවය කර ස්වකැමැත්තෙන් මෙරටට පැමිණ නැවත කොරියාවේ සේවය සඳහා පිටත්වීමට කැමැත්තක් දක්වන ශ්‍රමිකයින් පමණක් මෙම ක්‍රමවේදය හරහා තෝරා ගැනේ.

**අවශ්‍ය සුදුසුකම්**

- මූලික ගිවිසුම ප්‍රකාරව අවසරලත් කාලසීමාව තුළ ස්වේච්ඡාවෙන් මව් රටට පැමිණෙන ශ්‍රමිකයින් වීම
- වයස් සීමාව අවුරුදු 18 සහ 39 අතර වීම
- අයදුම්කරුවන් සිරගතවීමක් හෝ බරපතල දඬුවමකට ලක්වී නොසිටීම
- අයදුම්කරුවන් සඳහා කොරියානු ජනරජයෙන් පිටුවහල් කිරීමේ හෝ පිටත්වීමේ නියෝග වාර්තාවක් නොතිබීම. කොරියාවේ නීති විරෝධී ලෙස එක් දිනක් හෝ රැඳී නොසිටීම.
- අයදුම්කරුවන් ශ්‍රී ලංකාවෙන් පිටත්වීමේ තහනමකට ලක්නොකොට තිබීම.
- E-9 වීසා කාණ්ඩය සහ E-10 වීසා කාණ්ඩය යන වීසා කාණ්ඩ දෙක යටතේම වූ සේවා කාලයද ඇතුළුව වසර 05කට වඩා සේවා කාලයක් දකුණු කොරියාවේ සේවය කර නොමැති තැනැත්තන් විය යුතුය.
- කිසියම් තැනැත්තෙකු 2017 නොවැම්බර් මස ආගමන පාලක නීතිය සංශෝධනය කිරීමට ප්‍රථමව සිය රටට ආපසු ගොස් ඇත්නම් එම තැනැත්තා වසර 05ක් හෝ ඊට වැඩි කාලයක් කොරියාවේ සිටියදී එම තැනැත්තාගේ නම මෙම පරීක්ෂණය සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබන්නන්ගේ ලැයිස්තුවේ නම ඇතුළත්ව තිබිය හැක.එසේ වුවද,එවැනි තැනැත්තෙකු මෙම පරීක්ෂණය සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබනු නොලැබෙනු ඇත.

**ක්‍රමවේදය**

- විශේෂ කොරියානු භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සඳහා අයදුම්පත් ලබා ගැනීමට සුදුසුකම් ලත් රැකියා අපේක්ෂිතයින්ගේ නාම ලේඛණය කොරියානු මානව සම්පත් ආයතනය මඟින් කාර්යාංශය වෙත එවනු ලබන අතර ඉන්පසු එය ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ වෙබ් අඩවිය මඟින් ප්‍රසිද්ධ කරනු ලැබේ
- විභාග අයදුම්පත් නිකුත් කිරීම ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ වෙබ් අඩවිය හරහා මාර්ගගත ක්‍රමවේදය මඟින් පමණක් සිදු කරනු ලැබේ
- කොරියානු භාෂා පරීක්ෂණය පරිගණක ආශ්‍රිතව මාර්ගගත ක්‍රමවේදය හරහා පමණක් පැවැත්වේ.භාෂා පරීක්ෂණය සමත් වන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට යොමු කරනු ලැබේ.
- පසුව වෛද්‍ය පරීක්ෂණය හා නිරවුල් පොලිස් වාර්තාවක් ලැබුණු පසු ලිපිගොනුව සම්පූර්ණ කර එම තොරතුරු කොරියානු රැකියා වෙබ් අඩවියට ලියාපදිංචි කරනු ලැබේ.
- කොරියානු රැකියා වෙබ් අඩවියෙහි ලියාපදිංචි කරන ලද අයදුම්කරුවන් සඳහා පමණක් දකුණු කොරියානු රජයේ සේවා යෝජකයින්ගේ තේරීම මත සේවා ගිවිසුමක් නිකුත් කරනු ලැබේ.
- සේවා ගිවිසුමක් අත්සන් කරනු ලැබූ අයදුම්කරුවන්ගේ අවශ්‍ය ලේඛණ සම්පූර්ණ කල පසු විදේශ ගත වීම සිදු වේ.

**කොරියානු භාෂා විශේෂ විභාගය යටතේ කොරියානු රාජ්‍ය බලා පිටත් වන රැකියාලාභියෙකු විසින් පහත සඳහන් ගාස්තු කාර්යාංශය වෙත ගෙවීම් කල යුතුය.**

වීසා ගාස්තුව

බඳවාගැනීමේ ගාස්තුව

කාර්යාංශ ලියාපදිංචි ගාස්තුව